# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1819/29 - 2013 ජූලි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2013.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3(2) වන උපවගන්තිය යටතේ නිවේදනය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(2) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන වන මම, මුදල් හා ක්‍රමසම්පාදන විෂය භාර අමාත්‍යවරයා ද විමසා මෙම නිවේදනය මගින් -

(1) ඇමෙරිකානු ඩොලර් මිලියන තුන්සිය පනහක (ඇ.ඩො. 350.000,000) ක මුළු ආයෝජනයකින් යුත් කාමර 400කින් සමන්විත සුඛෝපභෝගී හෝටලයකින් ද, සම්මේලන මධ්‍යස්ථානයකින් ද, සූදු සහ ඔට්ටු ඇල්ලීමේ පහසුකම්වලින් ද, අලංකාර භෝජන ශාලා ද සහ ඒ හා සම්බන්ධව වෙනත් හවුල් ක්‍රියාකාරකම් වලට පහසුකම් ද ඇතුළු සියළු අංගෝපාංගයන්ගෙන් සපිරි විස්තීරන නිකේතනයක්, දේශීය රැකියා අවස්ථා දෙදහස් හයසියයක් (2,600) පමණ ජනනය කිරීමේ අරමුණින් ද යුක්තව බස්නාහිර පළාතේ කොළඹ, ඩී ආර් විජේවර්ධන මාවතේ ඉදිකර ක්‍රියාත්මක කිරීමේ මෙම ව්‍යාපෘතිය, ක්‍රමෝපාය සංවර්ධන පනතේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගනු ලබන බවත්, මෙම ව්‍යාපෘතිය රටට ආර්ථික සහ සාමාජීය ප්‍රතිලාභ හිමිකර දෙන අතර රටේ හුදර්ශනය වෙනස් කිරීමට ද තුඩුදිය හැකි බවත් දන්වා සිටින අතර, සීමාසහිත ලේක් ලෙෂර් හෝල්ඩින්ස් සමාගම ("ව්‍යාපෘති සමාගම") සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර ව්‍යාපෘති ගිවිසුමකට වර්ෂ 2013 ක් වූ ජූනි මස 27 වන දින එළඹෙන ලද බවත් දන්වා සිටිනු ලැබේ ;

(2) ඉහත කී ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ සීමාසහිත ලේක් ලෙෂර් හෝල්ඩින්ස් සමාගම ව්‍යාපෘති ගිවිසුමට එළඹුණු දිනය වන වර්ෂ 2013 ක් වූ ජූනි මස 27 සිට ක්‍රියාත්මක වන අතර, එකී ව්‍යාපෘතියේ වාණිජමය කටයුතු ඉහත කී ව්‍යාපෘති ගිවිසුමට එළඹුණු දින සිට මාස හතලිස් අටක (48) ක කාලයක් තුල ඇරඹිය යුතු බවත් ප්‍රකාශ කර සිටිනු ලැබේ ;

(3) ඉහත කී ව්‍යාපෘතියේ කාර්යය සඳහා සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව මෙහි උපලේඛනයේ දක්වා ඇති නිදහස් කිරීම් මෙම සමාගමට අදාල වන බවටද නිශ්චිතව දක්වනු ලැබේ.


1A - G 017984 — 360 (2013/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

(අ) **2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

(i) *සමාගම් ආදායම් බදු*

වසර දහය (10) ක කාලසීමාවක් සඳහා ව්‍යාපෘති සමාගමේ බදු ගෙවිය යුතු ලාභය දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන වලින් නිදහස් වේ (බදු නිදහස් කාලය). එකී වසර දහය (10) ක බදු නිදහස් කාල පරිච්ඡේදය තුල සහ ඉන්මතු වසර එක (01) ක කාල පරිච්ඡේදයක් සඳහා ලාභ වලින් කොටස්කරුවන් හට බෙදා දෙනු ලබන ලාභාංශ සඳහා බදු නිදහස ලැබේ.

එකී බදු නිදහස් කාලය ව්‍යාපෘති සමාගම ලාභ උපයන මුල් වසරේ ආරම්භයේ සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර තුන (03) කට පසු ආරම්භ වේ.

ඉන්මතු ඉහත සඳහන් බදු නිදහස් කාල පරිච්ඡේදයේ අවසාන දිනයට අනතුරුව එළඹෙන ඉක්බිති වසර දොලහක (12) ක ව්‍යාපෘති සමාගමේ ලාභය සහ ආදායමින් සියයට හය (6%) ක ප්‍රතිශතයක් හෝ අදාල බදු අනුපාතයෙන් සියයට පනහක (50%) වන දෙකින් කවර හෝ අවම අනුපාතයකට අර්ධ නිදහස් කිරීමක් හිමි වේ. (සහනකාරී බදු කාලය).

(ii) *ලාභාංශ මත බද්ද*

ඉහත පෙන්වා දී තිබෙන බදු නිදහස් කාල සීමාව සහ සහනකාරී බදු කාල සීමාව ඉකුත්වීමෙන් පසුව දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව එවිට බලපවත්වන සාමාන්‍ය බදු රාමුව ව්‍යාපෘති සමාගම කෙරෙහි අදාලවනු ඇත.

(iii) *රඳවාගැනීමේ බද්ද*

ප්‍රාග්ධන වියදම් සහ උපදේශකයින්ට ගෙවන ලද තාක්ෂණික ගාස්තුව සඳහා ලබාගත් විදේශ ණය මත පොලිය, කළමනාකරණ ගෙවීම්, පුරස්කාර ගෙවීම් සහ අලෙවිකරණ ගෙවීම් යන විෂයයන් සම්බන්ධයෙන් රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වේ.

මූලික කළමනාකරණ ගාස්තුව/පුරස්කාර වශයෙන් සිදුකරන ලද ගෙවීම් දළ මෙහෙයුම් ආදායම් වලින් සියයට තුනක (3%) ප්‍රමාණයක්, අලෙවිකරණ ගෙවීම් දළ මෙහෙයුම් ආදායම් වලින් සියයට එකයි දශම පහක (1.5%) ප්‍රමාණයක් සහ කළමනාකාර දිරි දීමනා ගාස්තු වශයෙන් සිදු කරන ලද ගෙවීම් දළ මෙහෙයුම් ලාභ වලින් සියයට දහයක (10%) ප්‍රමාණයක් නොඉක්මවිය යුතුයි.

(iv) *උපයනවිට ගෙවීම් බද්ද*

සේවකයින් 30 දෙනෙකුගේ උපරිමයකට යටත්ව සමාගමේ ප්‍රවාසික සේවකයන් සම්බන්ධයෙන් උපයන විට ගෙවිය යුතු බදු ගෙවීමෙන් නිදහස් වේ. මෙම බදු නිදහස ව්‍යාපෘතිය වාණිජමය කටයුතු ඇරඹීමේ දින සිට වසර පහක (05) කාලයක් සඳහා වලංගු වනු ඇත. ව්‍යාපෘති සමාගම ප්‍රවාසක සේවකයින් දේශීය සේවකයන් මගින් ක්‍රමාත්මකව ප්‍රතිස්ථාපනය කිරීමට උපරිම උත්සාහය ගත යුතුය.

(ආ) **2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත**

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුල ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ආනයන කිරීම සහ ව්‍යාපෘතියට අදාල දේශීය වශයෙන් මිළදී ගනු ලබන භාණ්ඩ සහ සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් වේ. මෙම බදු සහනය ව්‍යාපෘතියට/ව්‍යාපෘති සමාගම වෙත සෘජුවම කරන සැපයුම් පමණක් නොව ව්‍යාපෘති සමාගම අනුමත කරන කොන්ත්‍රාත්කරුවකු වෙත උප කොන්ත්‍රාත්කරුවකු විසින් කරනු ලබන සැපයුම් සඳහා ද අදාළ වේ.

ව්‍යාපෘතියේ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් පසු එකතු කළ අගය මත බදු ගෙවීම සැපයීමේ අගය මත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව අදාළ වනු ඇත.

උපලේඛනය (සම්බන්ධිතයි)

(ඇ) **1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත**

මෙම ව්‍යාපෘතිය යටතේ ඔට්ටු ඇල්ලීම සහ සූදු ව්‍යාපාරයේ යෙදෙන්නේ නම් එම ව්‍යාපාරය කරගෙන යාමෙන් ලැබෙන දල එකතුව මත සියයට පහක (5%) අනුපාතය අනුව වූ බද්දක් ඉහත කී පනත අනුව අයකරගනු ලැබිය යුතුය. එකී බද්දට පාරිභෝගිකයන්ගේ ආකර්ශනය දිනා ගැනීම සඳහා දෙනු ලබන පාරිතෝෂික දීමනා වියදම්/වට්ටම්/සංඝටිත ගාස්තු ඇතුලත් බදු අයත් නොවේ.

(ඈ) **2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන අයකිරීම් පනත**

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුල ව්‍යාපෘතිය සමාගම සෘජුවම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබීම සඳහා කරනු ලබන ආනයනයන් සඳහා වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් වලින් නිදහස් වේ. (ව්‍යාපෘති සමාගම විසින් සෘජුවම ආනයනය කිරීම් හෝ කොන්ත්‍රාත්කරුවන් හරහා සිදු කරවන ආනයනය කිරීම් වුවද) මෙහි අයිතම ඊ සඳහන් කොන්දේසීන්ට යටත්ව.

(ඉ) **2005 අංක 5 දරන මුදල් පනත**

ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලය වූ මාස හතලිස් අටක් (48) වූ කාලය තුළ, ව්‍යාපෘති සමාගමේ කොන්ත්‍රාත්කරුවන්ට ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් අයකිරීම් සහ ගෙවීම් අදාල නොවනු ඇත.

(ඊ) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය වූ මාස හතලිස් අටක (48) කාලය තුල දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිතව ව්‍යාපෘති සමාගම සෘජුවම හෝ කොන්ත්‍රාත්කරුවන් හෝ උප කොන්ත්‍රාත්කරුවන් මගින් ආනයනය කරනු ලබන ව්‍යාපෘතියට අදාල සියළුම ප්‍රාග්ධන භාණ්ඩ හා ව්‍යාපෘතියට අදාලව අනෙකුත් සියළුම ආනයන භාණ්ඩ රේගු බදු අයකිරීම් තුලින් නිදහස් වේ. කෙසේ වෙතත් තහනම් ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ දේශීය වෙළඳපොල තුලින් අවශ්‍ය ප්‍රමාණයට සහ ගුණාත්මකභාවයට සපයාගත නොහැකි නම් හෝ ව්‍යාපෘතිය සම්පූර්ණව නිමකිරීම සම්බන්ධයෙන් කාලය බාධාවක් වන්නේ නම් තහනම් ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ ආනයනය කිරීම සැලකිල්ලට ගනු ලබනු ඇත.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන, පා.ම.
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2013 ජූලි මස 18 වැනි දින,
කොළඹ දී ය.

08 - 150

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.